**ශීර්ෂය 303 - පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

ශීර්ෂය 303 - පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 සැප්තැම්බර් 25 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 105.95 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 100.30 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 5.65 ක් හෙවත් සියයට 5.33 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 72.80 | 67.28 | 5.52 | 7.58 |
| මූලධන | 33.15 | 33.02 | 0.13 | 0.39 |
| එකතුව | 105.95 | 100.30 | 5.65 | 5.33 |

(ආ) **වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් රු.163,383,508 ක් වූ ප්‍රතිපාදන දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබුණු අතර එම ප්‍රතිපාදනවලින් රු.163,265,361 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදනවලින් රු.118,147 ක් හෙවත් ලබා දී තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 0.07 ක ප්‍රමාණයක් ඉතිරි වී තිබුණි.

## 2.2. රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබූ සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 30301 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 5.50 | 5.47 | 3.00 | 3.38 | 25.00 | 13.38 |

## 2.3 පොදු තැන්පත් ගිණුම්

දෙපාර්තමේන්තුව යටතේ වන තැන්පත් ගිණුම් 05 ක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු. මිලියන 10.25 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු. මිලියන |
| 6000/0000/00/0001/0124/000 | 2.66 |
| 6000/0000/00/0002/0174/000 | 0.13 |
| 6000/0000/00/0013/0132/000 | 2.64 |
| 6000/0000/00/0016/0121/000 | 1.19 |
| 6000/0000/00/0017/0031/000 | 3.63 |
| | 10.25 |

**2.4 විගණන නිරීක්ෂණය**

---------------------

පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

---------------------------------------------

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

----------------------------------------

දෙපාර්තමේන්තුව විසින් මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් ලේඛණය විධිමත්ව හා යාවත්කාලීනව නඩත්තු කර නොතිබුණි.

**3.2 යහපාලනය හා ගිණුම්කටයුතුභාවය**

------------------------------------

**3.2.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

-----------------------------

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ආ), (ඇ), 4.2.2 (අ) මාර්ගෝපදේශ ප්‍රකාරව, ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුලත් කර ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර ඊළඟ එළඹෙන වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන කටයුතු විස්තරාත්මකව පිළියෙල කල යුතු බව හා ප්‍රසම්පාදන කාලසටහන් පිළියෙල කළ යුතු බව දැක්වෙතත් ඒ අනුව ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර නොතිබුණි.

**3.2.2 අභ්‍යන්තර විගණනය**

----------------------

2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009 (1) දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ කටයුතු පිළිබඳ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**3.2.3 විගණන හා කළමනාකරණ කමිටුව**

-----------------------------------

මෙම කමිටුව දෙපාර්තමේන්තුව තුල ක්‍රියාත්මක නොවන අතර අමාත්‍යාංශය විසින් පැවැත්වෙන විගණන හා කළමනාකරණ කමිටුව සඳහා සහභාගිවීම සිදු කර තිබුණි.

**3.3 වත්කම් කළමනාකරණය**

-------------------------

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

-------------------------------------

පහත සඳහන් වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

(i) 2011 වර්ෂයේ සිටම කහවත්තේ පිහිටි හිරමඩගම පේෂකර්මාන්ත පුහුණු පාසල ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ii) 2013 වර්ෂයේ සිට දෙපාර්තමේන්තුවට අයත් වාහනයක් නිෂ්ක්‍රීයව හා තවත් වාහනයක් ඌන උපයෝජිතව පැවති අතර මෙම වාහන වෙන්දේසි කිරීම සඳහා අමාත්‍යාංශයට භාර දී තිබුණ ද 2017 ජුනි වන විටත් වෙන්දේසි කර නොතිබුණි.

(iii) ඉඩමට ප්‍රවේශ වීමට නියමිත මාර්ගයක් හෝ නොමැති රාජගිරියේ ස්වාභාවික වර්ණ ගැන්වීමේ මධ්‍යස්ථානය පිහිටි ඉඩම හා ගොඩනැගිලි වර්ෂ 5 කට වඩා වැඩි කාලයක සිට ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. එසේම මෙම ඉඩමේ ඔප්පුවක් හෝ දෙපාර්තමේන්තුවට එය පවරා දුන් බවට ලියවිලි දෙපාර්තමේන්තුව සතු නොවීය. තවද මෙම මධ්‍යස්ථානය සඳහා 2017 වර්ෂයේ දී රු. 208,620 ක් වැය කරමින් ඉදිකිරීමක්ද සිදු කර තිබුණි.

**(ආ) බේරුම් නොකළ බැරකම්**

දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනට වර්ෂ 01 කට අඩු කාලයකට අදාල බේරුම් නොකළ බැරකම් රු.511,916 ක් විය.

## 3.4 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසි විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 1646 | සංචිත වාහනවල ධාවන සටහන් ඊළඟ මාසයේ 15 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2013 ජූලි 12 දිනැති අංක එස්ජ්/ජ්එස්/ජ්ජ්/ දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය | දෙපාර්තමේන්තුව සතු සියළු ඉඩම් හා ගොඩනැගිලි හා අනෙකුත් වත්කම් තක්සේරු කිරීමේ කාර්ය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සිදු කර නොතිබුණි. |

## 3.5 කාර්යසාධනය

2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) පේෂ කර්මාන්ත පුහුණු පාසැල් සඳහා සිසුන් බඳවා ගැනීම**

අත්යන්ත්‍ර පේෂ කර්මාන්තය පිළිබඳ අංග සම්පූර්ණ දැනුමක් හා පුහුණුවක් ලබාදෙන සහ මෙම කර්මාන්තයට අවශ්‍ය කළමනාකරුවන්, උපදේශකයින් සහ ව්‍යවසායකයින් බිහිකිරීම අරමුණු කර ගනිමින් දිවයිනේ විවිධ ප්‍රදේශවල පිහිටුවා ඇති පේෂ කර්මාන්ත පුහුණු පාසල් මඟින් වාර්ෂිකව නොමිලේ පාඨමාලා පවත්වනු ලැබේ. එක් අවුරුදු (2015 ජුලි 02 දින සිට 2016 ජුලි 31 දින දක්වා ) පේෂ කර්මාන්ත පුහුණු පාඨමාලාව සඳහා ක්‍රියාකාරී සැලැස්මට අනුව සිසුන්

175 දෙනෙකු බඳවා ගැනීමට සැලසුම් කර තිබුණද, ඒ සඳහා බඳවාගෙන තිබුණේ සිසුන් 161 දෙනෙකු පමණි. එයින් පාඨමාලාව සම්පූර්ණ කරන ලද සිසුන් සංඛ්‍යාව 135 ක් පමණක් විය.

**(ආ) මෝස්තර පුහුණු පාසැල් සඳහා සිසුන් බඳවා ගැනීම**

---

දේශීය අනන්‍යතාවය සහ සංස්කෘතියට උචිත පරිදි මෙන්ම දේශීය හා විදේශීය වෙළඳපොල ක්‍රියාකාරීත්වය ජයගත හැකි පරිදි අත්යන්ත්‍ර පේෂකර්මාන්ත ක්ෂේත්‍රයෙහි නිර්මාණශීලී සහ තරඟකාරී රෙදිපිළි නිෂ්පාදනය සඳහා නිෂ්පාදකයින් යොමු කිරීමේ අරමුණින් මෝස්තර නිර්මාණකරුවන් පුහුණු කිරීම සඳහා නේවාසික එක් අවුරුදු මෝස්තර පුහුණු පාඨමාලාවක් ගැටඹේ හා කටුබැද්ද මෝස්තර පුහුණු පාසැල් මඟින් පවත්වාගෙන යනු ලබයි. 2016 ජනවාරි 18 සිට 2017 ජනවාරි 17 දක්වා වූ අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් 25 දෙනෙකු බඳවා ගැනීමට සැලසුම් කර තිබුණද 20 දෙනෙකු පමණක් බඳවාගෙන තිබෙන අතර ඉන් සිසුන් 19 දෙනෙකු පමණක් පාඨමාලාව සම්පූර්ණ කර තිබුණි.

**(ඇ) පෞරුෂත්ව සංවර්ධන වැඩසටහන් පැවැත්වීම**

---

පේෂකර්මාන්ත පුහුණු පාසල්වලට 2015/2016 හා 2016/2017 අධ්‍යයන වර්ෂ සඳහා සිසුහු 328 ක් ද, මෝස්තර පුහුණු පාසල්වලට 2016 අධ්‍යයන වර්ෂය සඳහා සිසුහු 20 ක්ද වශයෙන් බඳවා ගෙන තිබුණි. එසේ බඳවා ගත් සිසුන් සඳහා පෞරුෂත්ව සංවර්ධන වැඩසටහන් 03 ක් පමණක් පවත්වා තිබූ අතර ඒ සඳහා සිසුන් 144 ක් පමණක් සහභාගි කරගෙන තිබුණි.

**(ඈ) ජාතික අත්යන්ත්‍ර රෙදිපිළි ප්‍රදර්ශනය**

---

පේෂකාර්මික ව්‍යවසායකයින්ගේ අලෙවි ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් වර්ෂයකට වරක් පවත්වනු ලබන ජාතික අත්යන්ත්‍ර රෙදිපිළි ප්‍රදර්ශනය 2016 දෙසැම්බර් 9 සිට 11 දක්වා බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේදී පවත්වා තිබුණි. එහිදී, ව්‍යවසායකයින් 35 ක් සඳහා පමණක් අලෙවි පහසුකම් ලබාදී තිබූ අතර සම්මානලාභීන්ට ත්‍යාග පිරිනැමීම, ශාලා වෙන් කිරීම, නිර්මාණ ප්‍රදර්ශනය හා ප්‍රචාරණ කටයුතු සඳහා රු.8,893,521 ක වියදමක් දරා තිබුණි.

**(ඉ) අලෙවි සල්පිල**

---

කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් ප්‍රවර්ධනය සඳහා තෙදිනක් පුරා පැවති අලෙවි සල්පිල 2016 මාර්තු 25 සිට 27 දක්වා බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේදී පවත්වා තිබුණි. එහිදී ව්‍යවසායකයින් 34 දෙනෙකුට අලෙවි පහසුකම් සපයා දී තිබුණි. ඒ සඳහා ශාලා වෙන් කිරීම, කුටි සකස් කිරීම හා අලෙවි ප්‍රචාරණය වෙනුවෙන් රු. 2,314,058 ක් වැය කර තිබුණි.

**(ඊ) අරමුණු ඉටු කර ගැනීම**

---

අත්යන්ත්‍ර පේෂකර්මාන්තය සංවර්ධනය සඳහා අදාල ප්‍රතිපත්ති සකස් කිරීම, පේෂකර්මාන්ත ක්ෂේත්‍රයට නව තාක්ෂණය හඳුන්වා දීම සහ අදාල සංවර්ධන කටයුතු සහ අත්යන්ත්‍ර පේෂකර්මාන්තය වර්ධනය සඳහා අවශ්‍ය පර්යේෂණ, අත්හදා බැලීම් හා සංරක්ෂණ කටයුතු යනාදි කාර්යයන් සමාලෝචිත වර්ෂය තුළ සිදු කර නොතිබුණි.

**3.6 අවිධිමත් ගනුදෙනු**

**-------------------**

දෙපාර්තමේන්තුව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**(අ) තලාව පේෂ පාසල අළුත්වැඩියාව**

**---------------------------------**

තලාව පේෂ පාසල අළුත්වැඩියාව සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු.1,776,062 ක් වැය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද මිල ගණන් ලබාගෙන තිබුණු බවට මිල ගණන් කැඳවීමේ ලිපිය අනුව අනාවරණය නොවූ අතර තෝරාගත් ලංසුකරු ඉදිරිපත් කළ මිල ගණන හැර එම ලංසුකරු පිළිබඳ තොරතුරු ප්‍රසම්පාදන ලිපිගොනුවේ නොතිබුණි.

(ii) 2016 අගෝස්තු 16 දින එළඹ ගත් ගිවිසුමේ 8 (අ) උප වගන්තිය ප්‍රකාරව කාර්මික නිලධාරී විසින් නිකුත් කරන ලද සහතිකයක් මත ඇස්තමේන්තු අගයෙන් සියයට 50 ඉක්මවා ඉටු කරන ලද වැඩ කටයුතුවල දළ වටිනාකමින් සියයට 75 ක් කොන්ත්‍රාත්කරුට ගෙවීමට එකඟ වී තිබුණද 2016 ඔක්තෝබර් 18 දින වන විට ඉටුකර ඇති වැඩවල වටිනාකම රු. 907,870 ක් වූ අතර එම මුළු ප්‍රමාණයම ගෙවා තිබුණි.

(iii) ඉහත ගිවිසුමේ 8 (ආ) උප වගන්තිය ප්‍රකාරව එම කාර්යය සතුටුදායක අන්දමින් නිමකළ බවට සහතික කිරීමෙන් අනතුරුව, ගිවිසගත් කොන්ත්‍රාත්තුවේ වටිනාකමින් සියයට 5 ක් මාස 06 ක කාලයක් ආරක්ෂණ ඇපයක් වශයෙන් රඳවා ගනු ලබන බව දක්වා ඇතත් රු. 43,409 ක් වූ රඳවා ගත් මුදල 2017 මාර්තු 22 දින එනම් මාස 04 කට ආසන්න කාලයකදී නිදහස් කර තිබුණි.

**(ආ) ප්‍රසම්පාදන සැලසුමට අනුකූල නොවීම**

**--------------------------------------**

සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 08 කදී සිදු කර තිබූ ඉදිකිරීම් හා අළුත්වැඩියාවන් සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුළත් වී නොතිබුණු අතර ඒවායේ වටිනාකම රු.2,499,299 ක් විය.

**3.7 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

**------------------------------**

**වන්දි ගෙවීම**

**-------------**

1980, 1981 හා 1982 වර්ෂවල පෞද්ගලීකරණය කරන ලද පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවට අයත් බලවේග ව්‍යාපාරවල වසර 10 කට අඩු කාලයක් සේවය කළ සේවකයන්ට වන්දි මුදල් ගෙවීම 2013 වර්ෂයේ දී ආරම්භ කර තිබූ අතර විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය අවසානය වන විට වන්දි ලාභීන් 445 දෙනෙකු සඳහා රු.45,834,000 ක වන්දි ලබා දිය යුතුව තිබුණි. ඊට අමතරව 2013 වර්ෂයේ සිට නිකුත් කරන ලද මාස 06 ඉක්ම වූ වන්දි චෙක්පත් පොදු තැන්පත් ගිණුමට බැර කර තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.3,630,543 ක ශේෂයක් පොදු තැන්පත් ගිණුමෙහි පැවතිණි.

## 3.8 කළමනාකරණ දුර්වලතා

-------------------------

නියැදි විගණන පරීක්ෂාවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව සතුව තිබූ බලවේග පේෂකර්මාන්ත ව්‍යාපාර පෞද්ගලික අංශයට දිගුකාලීන බදු පදනම මත ලබා දී තිබූ අතර මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

.

**(අ)** රජයේ ඉඩම් පැවරීම පිළිබඳ මාර්ගෝපදේශ මැයෙන් ජනාධිපති ලේකම් කාර්යාලය විසින් නිකුත් කර ඇති 1995 ජුලි 21 දිනැති එස්ඊඅයි/ඒ/4/34 දරන චක්‍රලේඛයේ දක්වා ඇති පහත සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(i) චක්‍රලේඛයේ 8 වන ඡේදයේ (ඇ) ප්‍රකාරව බදු කුලී ගෙවීම පැහැර හැරීම නිසා බදු ගිවිසුම නිතැතින්ම අහෝසි වන බව දක්වා තිබුණ ද යටිනුවර පෙහෙකම්හල සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ii) චක්‍රලේඛයේ 9 වන ඡේදය ප්‍රකාරව බදු දීමනාකරු විසින් බදු ගිවිසුම නිතිපතා අළුත් කළයුතු අතර හිඟ මුදල් එකතුවීමට ඉඩ නොතබා බදු කුලී එකතු කිරීම කළයුතු වුවත් යටිනුවර, තලාතුඔය හා උඩුනුවර පෙහෙකම්හල් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණු අතර හිඟ බදු මුදල රු.7,396,000 ක් විය.

**(ආ)** 1996 ජනවාරි 01 දින සිට රු.150,000 ක වාර්ෂික බදු මුදලකට බදු දී තිබූ බිබිල නිම්හම් ආයතනය ව්‍යාපාර කටයුතු සිදු නොකිරීම නිසා 2011අගෝස්තු 04 දින ඉඩම හා ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට භාරගෙන එදිනම ප්‍රාදේශීය ලේකම් වෙත භාරදී තිබුණි. කෙසේ නමුත් බදුකරුගෙන් අයවිය යුතුව පැවති රු.1,681,250 ක බදු මුදල අයකර ගැනීමට 2017 අගෝස්තු 31 දින වන විටත් නොහැකි වී තිබුණි.

**(ඇ)** 1993 ජනවාරි 31 දින සිට රු. 108,000 ක වාර්ෂික බද්දකට යටත්ව හිඟුරක්ගොඩ බලවේග පෙහෙකම්හල පිහිටි ඉඩම හා ගොඩනැගිල්ල සඳහා බදුකරු විසින් බදු ගෙවීම් පැහැර හැරීම නිසා 2001 පෙබරවාරි 12 දින ප්‍රාදේශීය ලේකම් වෙත භාර දී තිබූ නමුත්, දෙපාර්තමේන්තුවට අයවිය යුතුව පැවති රු.529,600 ක හිඟ බදු මුදල 2017 අගෝස්තු 31 දින වන විටත් අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

**(ඈ)** කුරුවිට බලවේග පෙහෙකම්හලේ ගැණුම්කරුගෙන් අයවිය යුතු මුදල් අයකර ගැනීමට පවරන ලද නඩුවේ තීන්දුවට අනුව අමතර කොටස් සඳහා හා දණ්ඩන පොලිය ලෙස අයවිය යුතුව තිබූ රු.1,355,079 ක මුදලින් තවදුරටත් අයවිය යුතුව පවතින රු.225,846 ක මුදලක් 2017 අගෝස්තු 31 දින වන විටත් අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

**(ඉ)** යටිනුවර බලවේග පෙහෙකම්හල 1995 ජුලි 14 දින තිස් අවුරුදු බදු පදනම යටතේ රු.212,000 ක වාර්ෂික බදු මුදලකට බදු දී තිබුණි. මෙම ඉඩමේ කොටසක අනවසර පදිංචිකාරියක් සිටින බැවින් එම ගැටළුව නිරවුල් කර ඉඩමේ නිදහස් සාමකාමී භුක්තිය බදුකරු වෙත භාරදීමට දෙපාර්තමේන්තුව පියවර නොගැනිම හේතුවෙන් බදු දුන් දින සිට 2012 වර්ෂය දක්වා අය විය යුතුව පැවති රු.2,756,000 ක බදු මුදල් 2017 අගෝස්තු 31 දින වන විටත් අයකර ගත නොහැකි වී තිබුණි.

**(ඊ)** තලාතු ඔය බලවේග පෙහෙකම්හල 2000 දෙසැම්බර් 01 දින රු.148,000 ක වාර්ෂික බදු මුදලකට තිස් අවුරුදු කාලයකට බදු දී තිබුණි. 2000 වර්ෂයේ සිට 2004 වර්ෂය දක්වා හා 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වූ වර්ෂ 08 ක කාලය සඳහා පමණක් රු.1,184,000 ක

මුදලක් බදුකරු විසින් ගෙවා තිබුණි. 2005 සිට 2012 දක්වා වූ වර්ෂ 08 ක කාලයට අදාල බදු මුදල වූ රු. 1,184,000 ක් අයකර ගත නොහැකි වී තිබුණි.

**(උ)** උඩුනුවර බලවේග පෙහෙකම්හල 2000 පෙබරවාරි 01 දින රු. 216,000 ක වාර්ෂික බදු මුදලකට තිස් අවුරුදු බදු පදනම මත බදු දී තිබුණ ද බදුකරු විසින් මෙම ස්ථානයේ ව්‍යාපාර කටයුතු සිදු නොකර අතහැර දමා තිබුණු අතර 2016 පෙබරවාරි 01 දින වන විට බදුකරුගෙන් අයවිය යුතු රු.3,456,000 ක බදු මුදල 2017 අගෝස්තු 31 දින වන විටත් අය කරගත නොහැකි වී තිබුණි.

**(ඌ)** කළුතර බලවේග ව්‍යාපාරයේ යන්ත්‍ර සූත්‍ර අමතර කොටස් වෙනුවෙන් සළුසල ආයතනයෙන් අයවියයුතු වූ රු.2,694,443 ක මුදල අයකර ගැනීමට නඩු පවරා තිබුණි. 1992 අප්‍රේල් 22 දින ලබාදුන් තීන්දුව අනුව මෙම මුදල වාරික 36 කින් අයවිය යුතු වුවත්, වාරික ඒකාකාරීව අයවී නොතිබුණු අතර වරින් වර රු.702,480 ක මුදලක් පමණක් 1999 වර්ෂය වන විට අයවී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් රු.1,991,962 ක් හිඟව තිබූ අතර එය අයකර ගැනීමට නීතිපති උපදෙස් විමසා තිබුණි. සිවිල් නඩු විධාන සංග්‍රහයේ 337(1) වගන්තිය ප්‍රකාරව අදාල හිඟ මුදල් අයකර ගැනීමේ කාලය ඉක්මවා ගොස් ඇති බැවින් නඩු පැවරීම සඳහා නීතිමය ප්‍රතිපාදන නොමැති බව නීතිපතිවරයා දන්වා තිබුණි.

**(එ)** තිස්සමහාරාමය බලවේග පෙහෙකම්හල 1995 සැප්තැම්බර් 07 දින සිට තිස් අවුරුදු බදු පදනම මත රු.60,000 ක වාර්ෂික බදු මුදලකට බදු දී තිබුණු අතර 2016 වර්ෂයේ සිට වාර්ෂික බදු මුදල රු.900,000 ක් දක්වා සංශෝධනය කර තිබූ නමුත්, එකී මුදල 2017 අගෝස්තු 31 දින වන විටත් අයකර ගත නොහැකි වී තිබුණි.

## 3.9 මානව සම්පත් කළමනාකරණය

**(අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 05 | 03 | 02 |
| (ii) | තෘතියික මට්ටම | 01 | - | 01 |
| (iii) | ද්විතියික මට්ටම | 109 | 83 | 26 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 42 | 34 | 08 |
| | එකතුව | 157 | 120 | 37 |

(ආ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 37 ක් පැවති අතර එයින් පුරප්පාඩු 07ක්, තනතුරු අහෝසි කිරීම නිසා බඳවා ගත නොහැකි වූ පුරප්පාඩු විය. ඉතිරි පුරප්පාඩු පිරවීමට දෙපාර්තමේන්තුවට නොහැකි වී තිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන) තනතුර 2007 සැප්තැම්බර් 04 දින සිට ද පරිපාලන නිලධාරී තනතුර 2008 නොවැම්බර් 14 දින සිට ද පුරප්පාඩුව පැවති අතර ඒ සඳහා නිලධාරීන් බඳවා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නොහැකි වී තිබුණි.